# යාපනයට මහල් 14 ක සුපිරි හෝටලයක්

## ආයෝජනය රුපියල් මිලියන 700 ක්

(චමින්ද මුණසිංහ)

යාපනයේ අලුතින් ඉදිකරනු ලබන ජෙට්වින්ග් යාල් හෝටලය සඳහා මුල්ගල තැබීම අග්‍රාමාත්‍ය දි.මු. ජයරත්න සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂ යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පසුගියදා (03) සිදුකෙරිණි.

ජෙට්වින්ග් යාල් හෝටලය ජෙට්වින්ග් සමූහ ව්‍යාපාරයේ සහ මර්කන්ටයිල් මර්චන්ට් බැංකු සමාගමේ ඒකාබද්ධ ව්‍යාපෘතියක් වශයෙන් ඉදිකෙරේ. යාපනයේ මහත්මා ගාන්ධි මාවතෙහි (පරණ ඔරලෝසු කණුව පාර) ඉදි කරනු ලබන මෙම හෝටලය මහල් 14 කින් යුක්ත වන අතර කාමර 76 කින් සමන්විත වේ. දෙස් විදෙස් සංචාරකයන් සඳහා අවශ්‍ය සෑම පහසුකමකින් යුක්තව ඉදිකෙරෙන මෙම හෝටලය සඳහා ආයෝජනය කරනු ලබන මුදල රුපියල් මිලියන 700 කි. මාස 18 ක කාලයකින් මෙම ඉදිකිරීම් කටයුතු නිමකිරීමට බලාපොරොත්තු වේ.

මෙම අවස්ථාවට සහභාගිවූ අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා වැඩිදුරටත් මෙසේ පැවසීය.

අද මෙම හෝටලය සඳහා මුල්ගල් තැබීම සංචාරක ව්‍යාපාරයේ නවෝදය පිළිබිඹු කිරීම පමණක් නොව උතුරේ ජනතාවගේ සුබසිද්ධිය සඳහා කරන දැවැන්ත සංවර්ධන වැඩපිළිවෙළේ තවත් විශාල පියවරක් බව සඳහන් කරන්න කැමතියි.

ඕනෑම ප්‍රදේශයක, පළාතක, රටක දියුණුව සඳහා ගෙනයෑමට ප්‍රධානතම සාධකය වන්නේ සාමය ඇති කිරීමයි. එය අපේ රජය විසින් සිදුකළා. ඒ සඳහා විශාල කැපකිරීමක් අපේ විරෝදාර රණවිරුවන් කළා. ඉන් පසුවයි රාජ්‍ය අංශය සංවර්ධන සඳහා පැමිණෙන්නේ. ඒ යටතේ තමයි යටිතල පහසුකම් සංවර්ධනය කරන්නේ. රාජ්‍ය අංශයයි එහි වගකීම දරන්නෙ. උතුරේ යටිතල පහසුකම් දියුණු කරමින් ජනතාවට අවශ්‍ය මූලික පහසුකම් දෙන්න රජය විශාල මෙහෙයක් දරනවා. මාර්ග, විදුලිය, ජලය පමණක් නොව ක්‍රීඩා, සංස්කෘතික කටයුතු වලටත් විශාල මුදලක් රජය විසින් ආයෝජනය කර තිබෙනවා. ධීවර ගොවි පමණක් නොව ව්‍යාපාරිකයන්ගේ දියුණුව සඳහාත් රජය සෑම පියවරක්ම ගන්නවා. ජනතාවට අවශ්‍ය සංවර්ධනය ලබාදෙන්න පෞද්ගලික අංශයත් අත්‍යවශ්‍යයි. එවැනි විශාල ආයෝජනයක් තමයි ජෙට්වින්ග් යාල් හෝටලය සඳහා අද ආයෝජනය කරන්නේ, එය දේශීය විදේශීය සංචාරකයන්ට පහසුකම් රැසක් ලබාදීමට හේතු වන අතර උතුරේ සංවර්ධනයටද විශාල පිටිවහලක් වෙනවා.

ලෝකයේ නම තිබෙන ආයෝජකයන් රැසක් අපි උතුරු පළාතට ගෙන්වනවා. එමගින් කර්මාන්තශාලා බිහිකර තව තවත් සංවර්ධනය වේගවත් කරනවා. මේ ප්‍රදේශයේ ජනතාව අපට සම්පතක්. මේ ජනතාවගේ ඡන්දය ලබාගත් යම් කණ්ඩායමක් අවශ්‍ය මොහොතකදී ජනතාවට වතුර බෝතලයක් වත් නොදී ලෝකය පුරා ඇවිදිමින් අප රට අපහසුතාවට පත්කරනවා. ඒ අය උතුරේ ජනතාවට කරන්නේ විශාල පාඩුවක්. උතුරේ ජනතාවගේ පරම්පරා දෙකක් ඒ අයව ආපස්සට ගෙනගියා. එය උතුරට පමණක් නොව මුළු රටටම බලපාන තත්ත්වයක් වුණා. මම කියන්න කැමතියි ඒ අයට නැවත අඳුරු අතීතයට මේ ජනතාව ගෙනයන්න එපා කියලා.

මෙම අවස්ථාවට සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය ඩග්ලස් දේවානන්ද, උතුරු පළාත් ආණ්ඩුකාර ජී.ඒ. චන්ද්‍රසිරි, මිලින්ද මොරගොඩ, ජෙට්වින්ග් හෝටල් සමාගමේ සාමානාධිකාරී රුවන් සමරසිංහ, ජෙට්වින්ග් ප්‍රවාහන සමාගමේ සාමානාධිකාරී ශිරෝමාල් කූරේ යන මහත්ම මහත්මීහු සහභාගී වූහ.



අගමැති දි.මු ජයරත්න, ආර්ථික සංවර්ධන බැසිල් රාජපක්ෂ යන මහත්වරු නව හෝටලයට මුල්ගල තැබීමට සූදානමින්.. ඇමැති ඩග්ලස් දේවානන්ද, මිලින්ද මොරගොඩ යන මහත්වරු පසෙකින් වෙති.